# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## දූෂණ විරෝධී (සංශෝධන)

**2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත සංශෝධනය**
**කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ
අමාත්‍යතුමා විසින් 2023 ඔක්තෝබර් මස 20 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2023 ඔක්තෝබර් මස 12 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[212 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 09.00** **තැපැල් ගාස්තුව : රු. 50.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

2 වන වගන්තිය : මේ වගන්තිය මගින් 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 4 වන, 7 වන, 8 වන, 10 වන, 17 වන, 21 වන, 23 වන සහ 80 වන වගන්ති සංශෝධනය කරනු ලබන අතර, එකී සංශෝධනයේ නීතියේ බලපෑම වනුයේ, ඒ පනතේ සිංහල භාෂා පාඨයේ දැක්වෙන ඇතැම් වැරදි පද නිවැරදි කිරීම වේ.

එල්.ඩී.ඕ. 65/2023

**2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2023 අංක ........ දරන දූෂණ විරෝධී (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය

2. මෙහි උපලේඛනයේ *I වන තීරයේ* නිශ්චිතව දක්වා ඇති 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ වගන්ති, එම උපලේඛනයේ *II වන තීරයේ* අනුරූපී සටහනේ නිශ්චිතව දක්වා ඇති වචන වෙනුවට *III වන තීරයේ* අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති 2023 අංක 9 දරන පනතේ ඇතැම් වගන්ති සංශෝධනය කිරීම

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

## උපලේඛනය

[2 වන වගන්තිය]

| I වන තීරය | II වන තීරය | III වන තීරය |
|---|---|---|
| සංශෝධනය කරනු ලබන වගන්ති | ඉවත් කිරීම | ඇතුළත් කිරීම |
| 4 (1) | ව්‍යවස්ථාදායක සභාවේ | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ |
| 4 (2) (උ) | ව්‍යවස්ථාදායක මණ්ඩලය | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව |
| 4 (3) | ව්‍යවස්ථාදායක සභාවේ | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ |
| 7 (2) | ව්‍යවස්ථාදායක මණ්ඩලයේ | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ |
| 8 (2) | ව්‍යවස්ථාදායක සභාවේ | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ |
| 10 (1) | ව්‍යවස්ථාදායක මණ්ඩලය | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව |
| 17 (1) | ව්‍යවස්ථාදායක මණ්ඩලයේ | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ |
| 17 (2) | ව්‍යවස්ථාදායක මණ්ඩලය | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව |
| 21 | ව්‍යවස්ථාදායක මණ්ඩලයේ | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ |
| 23 (3) | ව්‍යවස්ථාදායක සභාවේ | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ |
| 80 (1) (ඔ) | ව්‍යවස්ථාදායක සභාවේ | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ |

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී